**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබියයුතු රු.3,509,630 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ණයහිමියෝ සහ ප්‍රාග්ධන වියදම් රු.9,334,621 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) උපචිත විශ්‍රාම වැටුප් රු.1,337,440 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) විවිධ කර්මාන්ත ණයහිමියෝ ආරම්භක ශේෂය රු.23,013,000 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වැල්ලව ඊ පුස්තකාලයේ රු.925,284 ක් වූ ගොඩනැගිලි වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(උ) සභාව සතු ඉඩම් 17 ක වටිනාකම රු.22,451,000 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර රු.445,000 ක් වූ ඉඩම් 03 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) මාස්පොත ආදාහනාගාරයට මිලදීගෙන තිබුණු ජෙනරේටරයේ වටිනාකම රු.1,080,975 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) වටිනාකම රු.755,500 ක් වූ පරිගණක උපාංග රු.75,550 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සභාව සතු යතුරු පැදියක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියෝ රු.300,000කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.503,697 ක් වූ පරිගණක උපාංග සහ ලී බඩු උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.

(ග) 2015 වර්ෂයේ රු.168,447 ක් වූ විදුලි ගබඩා අවසන් තොගය ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේදී විදුලි ගබඩා තොගය රු.336,894 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**---------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 11 ක ශේෂ, උපලේඛනවල සහ ලෙජරය අනුව ශේෂ සමඟ සැසඳීමේදී රු.110,518,649 ක වෙනසක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**---------------------**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම්වල රු. 169,855,860 ක අවිනිශ්චිත ශේෂයක් විය.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**-------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.385,557,687 ක ලැබිය යුතු ගිණුම් ශේෂයෙන් වසරක් ඉක්මවා නිරවුල් වී නොතිබුණු ශේෂය රු.246,468,317 ක් විය.

(ii) වෙනත් ආයතන වල තැන්පත්/අත්තිකාරම් වශයෙන් දැක්වෙන රු.1,194,618 ක් සහ වෘත්තීය සමිතියකට ලබාදී තිබුණු රු.100,000ක් සමඟ පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.282,809,804 ක් වූ ගෙවියයුතු ශේෂයෙන් වසරක් ඉක්මවා නිරවුල් කර නොතිබුණු ශේෂය රු.37,082,977 ක් විය.

(ii) රු.230,987,398 ක් ණයහිමියන් සඳහා කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.47,294,526 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) ජංගම වත්කම් සහ ජංගම වගකීම් පිළිවෙලින් රු.89,717,385 ක් සහ රු.4,370,036 ක් ජ'නල් සටහන් මගින් සමුච්චිත අරමුදලට ගැළපීමට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | |
| (i)මු.රෙ. 571 (2) | 512,375 | වර්ෂ 02 ඉක්මවා තිබූ තැන්පත් 143 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 1645 සහ 1646 | - | වාහන 16 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාවේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග පළාත් පාලන ආයතනයේ නම සලකුණු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.202,247,275 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.124,733,524 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 11,420 | 13,715 | 13,411 | 24,728 | 11,205 | 10,911 | 10,368 | 10,336 |
| (ii) බදු කුලී | 2,700 | 1,864 | 1,886 | 10 | 1,121 | 1,325 | 1,484 | 32 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,650 | 2,513 | 803 | 1,007 | 1,588 | 1,797 | 1,797 | 261 |
| (iv) වෙනත් ආදායම් | 171,397 | 283,252 | 169,269 | 251,246 | 133,204 | 220,406 | 95,455 | 229,329 |
| එකතුව | 187,167 | 301,344 | 185,369 | 276,991 | 147,118 | 234,439 | 109,104 | 239,958 |

සටහන

2017 වර්ෂයේ රැස්කල ආදායම් තුළ පෙර වර්ෂවල රු.මිලියන 114 ක් වූ හිඟ අය කිරීම්ද ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම රු.මිලියන 301 ක් හා රැස්කළ ආදායම රු. මිලියන 185 ක් වූ අතර ඉකුත් වර්ෂ වල හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 277 ක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි. නමුත් ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් සභාව විසින් ඉදිරිපත් කල වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශන වටිනාකම් අතර නොසැසඳීම් පවතින බව නිරීක්ෂණය විය.

**2.2.3 වරිපනම් හා බදු**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.24,727,685 ක් වූ වරිපනම් හා අක්කර බදු වලින් රු.12,116,119 ක හිඟ ශේෂය වර්ෂ 03 ක් ඉක්මවා තිබුණි.

(ආ) වරිපනම් බදු හිඟයෙන් අයවීම සියයට 68 ක් හා බිල් කිරීමෙන් අයවීම් සියයට 58 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟය රු.24,727,685 ක් විය.

**2.2.4 බදු කුලී**

**----------**

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ රු.1,864,000 ක බදුකුලී සම්පූර්ණයෙන්ම ලැබී තිබූ අතර, වර්ෂය ආරම්භක හිඟයෙන් රු.10,000 ක් අයවිය යුතුව තිබුණි..

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු.8,569,415 ක් සහ රු.231,729,437 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධනය**

**----------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 1988 අගෝස්තු 23 දින හා අංක 570/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබූ අතුරු ව්‍යවස්ථා හා පළාත් සභාව විසින් පැනවූ අතුරු ව්‍යවස්ථා සභාව වැළඳගෙන තිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණු රු.14,404,536 ක් වූ කර්මාන්ත 39 ක් සමාලෝචිත වර්ෂය තුල ඉටු කර තිබුණි.

(ඈ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-----------------------------

ඇස්තමේන්තු වටිනාකම රු.81,000,000 ක් වූ කර්මාන්ත 4 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන වෙනුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.490,000 කින් රු.8,865 ක් පමණක් වැයකර තිබුණි.

(ii) 2016 වර්ෂයේදී රු.2,396,728 ක් වැයකර ඉදිකර තිබුණු නොදිරන කසළ වර්ගීකරණ මධ්‍යස්ථානය 2018 ජූලි 11 දින වනවිටත් නිශ්කාර්යව පැවතුණි. තවද, මෙම මධ්‍යස්ථානයට ජලය හා විදුලිය වැනි මූලික අවශ්‍යතා ලබාදීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

--------------------

පාරිසරික ගැටළු හේතුවෙන් කර්මාන්ත 06 කට සමාලෝචිත වර්ෂය සඳහා වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්ව නොතිබුණි.කෙසේ වුවද, සභාව ජනතාවගේ දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. ඩෙංගු මදුරුවන්ගෙන් තොර ආදර්ශ පාසල තේරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ බව සඳහන් කර තිබුණද, ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදිත රු.100,000 මුළු මුදලම ඉතිරිව තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරගම බහු කාර්ය ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කර්මාන්ත 2 ක වැඩියෙන් ගෙවා තිබුණු රු.101,196 ක් ආපසු අයකර ගෙන තිබුණද, මිනුම් නිවැරදිව නොගැනීම, ගිවිසුම්ගත මිළ ගණන් භාවිතා නොකිරීම වැනි කරුණු මත සාවද්‍ය ගෙවීම් සිදු කිරීමට වාර්තා පිළියෙල කිරීම, නිර්දේශ කිරීම සහ අනුමත කිරීම සිදුකළ නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

සභාවේ තනතුරු 12 කට අදාළව පුරප්පාඩු 33 ක් පැවතුණි.

(ආ) සේවක ණය

සේවය හැරයාම හා මිය යාම හේතුවෙන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.89,815 ක් අයකර ගෙන නොතිබුණි

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) සභා බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි 71 න් 70 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඒවායේ අවශ්‍ය සංවර්ධන කටයුතු ද සිදුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී ව්‍යාපෘතියක් මගින් ඉදිකර තිබුණු සායන මධ්‍යස්ථාන 05 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

සභාවේ තිබෙන එහෙත් සභාවට පවරා නොගත් ගල්රෝලක් වර්ෂ 03 ක කාලයක් නිශ්කාර්යව පැවතුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 සැපයීම් හා සේවා

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි මිල ගණන් ලබා ගැනීමකින් තොරව රු.144,154 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සේවක අභිප්‍රේරණය සහ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම, සමාජ සුභ සාධන කටයුතු 10 ක් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සැලැස්ම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.3,400,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

--------------------------

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම.<br>(ii) මූල්‍ය ප්‍රකාශන සමග උපලේඛන ඉදිරිපත් නොකිරීම.<br>(iii) ප්‍රා.ස 19 වාර්තාව පිළියෙල කර නොතිබීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | (i) හිඟ ආදායම් අයකිරීමේ දුර්වලතා<br>(ii) හිඟ ආදායම් වාර්තා සකස් නොකිරීම<br>(iii) ත්‍රීරෝද රථ ආදායම් අය නොකිරීම |
| (ඇ) මිලදී ගැනීම් ක්‍රියාවලිය | සියළුම මිලදී ගැනීම් ලේඛනගත නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | අවිධිමත් ගෙවීම් සිදුකර තිබීම. |